**ලුණුගල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 30 වන දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ලුණුගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුමක ශේෂය රු.484,092 ක් වුවත්, එය රු.806,579 ක් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් ජංගම වත්කම් රු.322,487 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව ත්‍රීවීල් රථගාල් 06 කින් ලැබිය යුතු ආදායම් රු.170,200 ක් ගිණුම්ගත නොකිරිම හේතුවෙන් අතිරික්තය සහ ජංගම වත්කම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අඩාවත්ත බංගලා කොටස ජල ව්‍යාපෘතියෙහි වියදම් ණයහිමියන් ලෙස රු.100,000 ක් වෙන්කර තිබුණද, මෙම කර්මාන්තය ක්‍රියාත්මක වී නොතිබුණු බැවින්, වර්ෂයේ වියදම හා වගකීම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩා ඉවත් කළ පැරණි කාර්යාලයීය ගොඩනැඟිල්ලේ වටිනාකම රු.150,000 ක් වැඩියෙන් ගිණුම් වල දක්වා තිබීම හේතුවෙන් එම වටිනාකමෙන් වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළව පුස්තකාල පොත් මිළදී ගැනීම් සහ පොත් පරිත්‍යාග එකතුව රු.259,454 ක් වුවද, එය රු.219,156 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීමේ ගිණුම රු.40,298 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 **අවිනිශ්චිත ගිණුම්**

--------------------

ඉකුත් වර්ෂවල සිට දිගින් දිගටම පැවත එන රු.403,670 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කර නොතිබුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

(අ) **ලැබිය යුතු ගිණුම්**

-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.21,557,368 ක් වු ලැබිය යුතු ගිණුම් ශේෂය තුළ වර්ෂ 7ක් කල් පසු වු කඩ කුලී රු.852,880 ක්, අක්කර බදු රු.29,499 ක් , හිඟහිටි ජල ගාස්තු රු.965,628 ක්, හිඟහිටි ටෙන්ඩර් කඩකුලී රු.2,370,719 ක්, හිඟහිටි ගෙවල් කුලී රු.13,548 ක්, හිඟහිටි වරිපනම් රු.336,656 ක් , හිඟහිටි වෙනත් ආදායම් රු.2,506,328 ක් හා වර්ෂයක් කල්පසු වු හිඟහිටි ප්‍රාග්ධන ආධාර රු.14,482,110 ක් අයකරගෙන නොතිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 22,108,645 ක් වු ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ වර්ෂයක් කල්පසු වු වියදම් ණය හිමියෝ රු.260,462 ක් හා කර්මාන්ත ණය හිමියෝ රු.21,848,183 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

-----------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.83,665,126ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 **අනුකූල නොවීම්**

-------------------

1.3.5.1 **නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

------------------------------------------------------------------------------

නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවු අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත 158,159 වගන්ති | 2,011,163 | ඉකුත් වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාළ හිඟ ආදායම් අය කරගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | | |
| (i) 217 රීතිය | | | සියලුම ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳව ප්‍රා.ස.46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ii) 218 රීතිය | | | සභාවට අයත් ඉඩම් හා ගොඩනැඟිලි වාර්ෂිකව පරීක්ෂා කර වාර්තාවක් සභාවට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 104(3) | 60,215 | | බැකෝ යන්ත්‍රයකට සිදුවී තිබුණු අනතුර සම්බන්ධයෙන් වූ අලාභය සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 104(4) | | | අනතුර සිදුවී මාස 3 ක් ගතවීමට පෙර පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කලයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 110 | | | හානි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**
----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,464,146 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,670,733ක් විය.

2.2 **මූල්‍ය පාලනය**
----------------

2016 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ රු.1,279,678 ක ශේෂයකින් සමන්විත සභාවට අයත් බැංකු ජංගම ගිණුමක් මෙහෙයුම් කටයුතු වලින් තොරව පවත්වාගෙන ගොස් තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුග ත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 257,000 | 259,225 | 194,164 | 65,061 | 257,000 | 246,175 | 150,373 | 95,801 |
| (ii) කුලී | 6,649,625 | 1,048,850 | 573,075 | 475,775 | 4,346,024 | 1,063,740 | 544,747 | 510,993 |
| (iii) බලපත්‍ර ගාස්තු | 906,000 | - | - | - | 741,000 | - | - | - |
| (iv)වෙනත් ආදායම | 323,500 | 1,398,107 | 963,048 | 435,059 | 298,500 | 1,340,681 | 912,207 | 428,474 |
| එකතුව | 8,136,125 | 2,706,182 | 1,730,287 | 975,895 | 5,642,524 | 2,650,596 | 1,607,327 | 1,035,268 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල්කල ආදායම රුපියල් මිලියන 2.7 ක් වූ අතර, වර්ෂය තුල රැස්කල ආදායම රුපියල් මිලියන 1.7 ක් විය. කෙසේ වුවත් වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 9.75 ක ආදායමක් අයකර ගැනීමට තිබුණු අතර, පෙර වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම් අය කර ගැනීම සියයට 6 කින් අඩුවී තිබුණි.

### 2.3.3 වරිපනම් හා බදු

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව දියුණු ගම් ප්‍රදේශයන් හඳුනාගෙන නව වරිපනම් ගාස්තු තක්සේරුකර අය කරගත යුතු වුවත්, 2004 වර්ෂයේ තක්සේරුව පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු අයකර තිබුණි.

### 2.3.4 කුලී

1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වර්ෂ පහකට වරක් බදු කුළිය තක්සේරුකර ගිවිසුම් ඇතිකරගත යුතු වුවත්, එසේකර නොතිබුණි. ඒ අනුව වර්ෂ 2007, 2012 යන වර්ෂවල තක්සේරු මත සමාලෝචිත වර්ෂයේ කුලී අයකර තිබුණි.

### 2.3.5 බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂයට අදාළව ව්‍යාපාර 14 කින් අයකළ යුතු බලපත්‍ර ගාස්තු රු.98,000 ක් විය.

2.3.6 **වෙනත් ආදායම්**

------------------

(අ) i. ප්‍රදේශයේ ජල ව්‍යාපෘති දෙකකින් ජලය ලබා ගන්නා ජල පාරිභෝගිකයින් 254 ක් සඳහා ජල මනු සවිකිරීමෙන් තොරව මාසික ගෘහස්ථ ඒකකයක් සඳහා රු.100 ක ස්ථාවර ගාස්තුවක් පමණක් අයකර ගෙන තිබුණි.

ii. දීර්ඝ කාලීනව පැවති හිඟ ජල ගාස්තු අයනොවීම මත ජල සම්බන්ධතාවය විසන්ධි කරන ලද ජල පාරිභෝගිකයින් 96 දෙනෙකුගෙන් 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු. 459,713 ක හිඟ ජල ගාස්තු අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) බැකෝ ලෝඩරය කුලියට දීම වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දින දක්වා යන්ත්‍ර පැය 100.9 ක් සඳහා රු. 353,717 ක ගාස්තුවක් අයකර ගෙන නොතිබුණි.

2.3.7 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවෙන් හා වෙනත් ආයතනවලින් උසාවි දඩ රු.8,742,676 ක් සහ මුද්දර ගාස්තු රු.839,829 ක් අයවිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1 **කාර්ය සාධනය**

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2017 දෙසැම්බර් 31 දින වනවිටත් කාරණා 10 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

(ඇ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේදී ඉඩමක් මිළදී ගෙන ඒ සඳහා රු.93,200 ක බිම් කුලියක් ගෙවා තිබුණද, , 2018 අගෝස්තු වනවිටත් ඉඩම නිශ්කාර්යව පැවතුණි.

(ඇ) **තිරසාර සංවර්ධන ඉලක්ක**

------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 වනවිටත් සකස් කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

**හානි සහ පාඩු**

---------------

2016 වර්ෂය සඳහා සභාවට අයත් බැකෝ ලෝඩරය පූර්ණ රක්ෂණය කර තිබුණද, 2016 ජූලි මාසයේදී බැකෝ ලෝඩරයට සිදුවූ අනතුර සම්බන්ධයෙන් රු.60,215 ක අලාභය ගෙවීමට නොහැකි බව රක්ෂණ ආයතනය දන්වා තිබුණි.

3.3 **මානව සම්පත් කළමණාකරණය**

--------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලේකම්, කාර්මික නිලධාරි, කළමනාකරණ සහකාර හා පෙර පාසැල් ගුරු, පුරප්පාඩු 04 ක් සහ සංවර්ධන නිලධාරින් 02 ක් හා මාර්ග කම්කරු 22 ක අතිරික්තයක් පැවතුනි.

3.4 **වත්කම් කළමනාකරණය**

----------------------------

3.4.1 **නිශ්ක්‍රීය වත්කම්**

------------------

2010 වර්ෂයේදී පස්සර ප්‍රාදේශීය සභාවෙන් ලුණුගල ප්‍රාදේශිය සභාවට පවරා තිබුණු පොත් අගය රු. 107,500 ක් වූ අබලන්ව තිබුණු අත් ට්‍රැක්ටරය අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5 **ප්‍රසම්පාදනය**

---------------

3.5.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

-----------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. **පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|---|
| | --------- | | ---------- |
| (අ) | ගිණුම්කරණය | (i) | අවිනිශ්චිත ගිණුම් ශේෂය නිවැරදිව හඳුනාගෙන නිරවුල් නොකිරීම. |
| | | (ii) | එකම වටිනාකම දෙවරක් ගිණුම්ගත කර තිබීම. |
| (ආ) | ණයගිම් | (i) | උපලේඛන පිළියෙළ නොකිරීම. |
| | | (ii) | කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් | (i) | වත්කම් ලේඛන නඩත්තු කර නොතිබීම. |
| (ඈ) | සේවක කළමනාකරණය | (i) | කාර්ය මණ්ඩලය අනුමත කර නොගැනීම. |
| | | (ii) | අතිරික්ත සේවකයන් රඳවා ගැනීම. |
| | | (iii) | ඌන සේවකයින් සම්පූර්ණ කර නොගැනීම. |
| | | (iv) | සේවකයින්ට විධිමත්ව රාජකාරි පවරා නොතිබීම. |